**ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල - 2016**

-----------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා රේගුවේ, රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර මතය සඳහා පදනම**

----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන්, 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුවේ, රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ප්‍රමිතය ප්‍රකාරව, අස්තිත්වයක වත්කම් එම අස්තිත්වය විසින් පාලනය කල යුතු අතර අස්තිත්වයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා එම වත්කම් ප්‍රයෝජනවත් විය යුතුය. එහෙත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල ධාරණ වටිනාකම රු.111,881,167 ක් ලෙස වාර්තා කර තිබුණද, එම වත්කම් අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා නොකර ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන බව නිරීක්ෂණය වූ අතර මෙම වත්කම් වලට අදාළව සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම රු.30,807,693 ක් අරමුදලේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 21 (ඉ) ප්‍රකාරව, අස්තිත්වයක අනුමත කල අයවැය ලේඛනයක් නිකුත් කර ඇත්නම් අතිරේක මූල්‍ය ප්‍රකාශනයක් වශයෙන් අයවැය ගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා අතර සංසන්දනයක් හෝ මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස දැක්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළ අයවැයගත තොරතුරු අනාවරණය කර නොතිබුණි .

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයේ 13 වන ඡේදය ප්‍රකාරව, රු.500,000 ක් වූ පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස වෙන්ව වර්ගීකරණය නොකර පරිගණක උපාංග යටතේම ගිණුම්ගත කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 69 වන ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම අදාළ වත්කම පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්වයට ගෙන ආපසු ආරම්භ කල යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි, මිළදී ගත් දින සිට ක්ෂය කිරීම අරමුදලේ ප්‍රතිපත්තිය බව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණි. ඒ අනුව ප්‍රමිතියේ සඳහන් උපදෙස්වලට අනුකූල නොවන ලෙස ක්ෂය ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.15,682,137 ක් වැඩියෙන් සහ ජංගම නොවන වත්කම්වල ධාරණ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

-----------------------------

අරමුදල සඳහා ආදායම් හඳුනාගැනීම සඳහා වූ සාධාරණ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රේගු විමර්ශන ලිපිගොනු 11 කට අදාළව අරමුදලට බැර විය යුතු රු.25,403,067 ක් ගිණුම්වලින් අත්හැරී තිබූ අතර විමර්ශන ලිපිගොනු 39 කට අදාළව මෙම අරමුදලේ ආදායම රු.38,257,023 කින් අඩුවෙන්ද රු.28,307,806 කින් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රේගුව සහ මෙම අරමුදලේ පරිහරණය සඳහා සමාලෝචිත වර්ෂයේදී මිළදී ගෙන තිබුණු රු.3,618,928 ක් වටිනා ලිපිද්‍රව්‍යවලින් අරමුදලේ කටයුතු සඳහා අදාළවන ලිපිද්‍රව්‍යවල පිරිවැය සහ වර්ෂය අවසානයට පැවති තොගයේ පිරිවැය වෙනම හඳුනාගෙන ගිණුම්ගත කිරීමකින් තොරව සම්පූර්ණ පිරිවැයම අරමුදලේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) මාසික කුලී පදනම මත ලබාගත් වාහන 02 ක් වෙනුවෙන් ගෙවා තිබූ රු.182,397 ක් විදේශීය පුහුණු වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණු අතර දේශීය පුහුණු වැඩසටහනක් වෙනුවෙන් ගෙවා තිබූ රු.255,439 ක් විදේශ පුහුණු වියදම් යටතේ ගිණුම් ගත කර තිබුණි. තවද, විදේශ ගමන් සඳහා ගෙවා තිබූ උණුසුම් ඇඳුම් දීමනාවල එකතුව වූ රු.42,832 ක් දේශීය පුහුණු වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණු අතර වාහන කුලී වියදම් රු.371,367 ක් පුවරු සිහිවටන වියදම් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ දක්වා තිබුණි.

(ඈ) යන්ත්‍ර හා කාර්යාල උපකරණ නඩත්තුව සඳහා වැය කර තිබූ රු. 11,332,185 ක් වත්කම් මිලදී ගැනීම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම්වල පිරිවැය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබූ අතර යන්ත්‍ර හා කාර්යාල උපකරණ නඩත්තු වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි .

(ඉ) ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ වටිනාකම රු.7,058,000 ක් පරිගණක උපාංග යටතේ දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම රු.2,031,379 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රේගුව සහ කළමනාකරණ හා වන්දි අරමුදලේ අන්තර් ලෙජර් ගනුදෙනු සටහන් කිරීම සඳහා පාලන ගිණුමක් පවත්වාගෙන නොතිබුණි.

(උ) 2016 ඔක්තෝබර් මාසයට අදාළව ලබාගැනීමට ඉදිරිපත් නොවූ ත්‍යාග වටිනාකම් රු.720,114 ක් ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) 2014 වර්ෂයේදී මිළදී ගෙන තිබූ රු.567,550 ක් වටිනා පුස්තකාල පොත්, රු.1,851,696 ක් වටිනා උපාංග හා සවිකිරීම්, රු.468,000 ක් වටිනා රූපවාහිනී යන්ත්‍රයේ පිරිවැය සහ එම වත්කම් වලට අදාළ එකතුව රු.467,952 ක ක්ෂය ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට විමර්ශන කටයුතු අවසන්ව තිබූ සිද්ධි ලිපිගොනු 81 කට අදාළව පනවා තිබූ දණ්ඩන මුදල වූ රු.1,597,390,932 කින් අරමුදලේ සියයට 20 ක් වූ දායක මුදල් රු.319,478,186 ක් අරමුදලේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව උපචිත පදනමට පිළියෙල කළ යුතු වුවත් මුදල් පදනම අනුගමනය කර තිබීම ඒ සඳහා හේතුවී තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට බැර කර තිබූ රු.2,366,174,629 කින් සියයට 40 ක් හෙවත් රු.946,469,851 ක් පනතේ විධිවිධාන ප්‍රකාරව රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලට බැර විය යුතු වුවද, එම අරමුදලට බැර කර තිබුණේ රු.936,815,186 ක් විය. ඒ හේතුවෙන් රු.9,654,665 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට ප්‍රමාණාත්මක හේතු පැහැදිලි නොකෙරුණි.

(ආ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අනුව ක්ෂය වටිනාකම සහ ලෙජර් ගිණුමේ දක්වා තිබූ වටිනාකම් අතර රු.2,195,431 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මාස තුනකට අදාළව විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වූ දණ්ඩන ආදායම් සහ ඊට අදාළ උපලේඛනය අතර රු.9,222,650 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) සමුච්චිත අරමුදලට අදාළව භාණ්ඩාගාර පොත් අනුව හා දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂය ආරම්භයේදී හා වර්ෂය අවසානයේදී පිළිවෙලින් රු.91,221,893 ක හා රු.111,308,874 ක වෙනස්කම් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය තුළ 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදලෙහි අගය රු.4,731,374,550 ක් ලෙස වාර්තා කර තිබුණද, 2016 ජනවාරි 01 දින ඉදිරියට ගෙන එන ලද ශේෂය රු.4,731,468,150 ක් වූයෙන් රු.93,600 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම රු.179,115,489 ක් වුවද, වියදම් උපලේඛනය අනුව එම වටිනාකම රු.178,785,310 ක් වීමෙන් රු.330,179 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා උපයෝගී කරගෙන තිබූ ජ'නල් සටහන් හා පෙර වර්ෂ ගැලපීම් රු.38,321,939 කට අදාළ ලේඛනගත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, අරමුදලේ මෙහෙයුම් අතිරික්තය රු.727,612,118 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.450,789,616 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.276,822,502 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සමස්ත වියදම රු.116,355,742 කින් ඉහළ ගොස් තිබුණද, අරමුදලේ ආදායම රු.348,749,758 කින් ඉහළ යාම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයේ රු.5,385,778 ක් වූ දේශීය පුහුණු වියදම සමාලෝචිත වර්ෂයේදී රු.18,832,173 ක් දක්වා සියයට 250 කින් වැඩි වී තිබුණි. රේගු නියාමකවරුන් සඳහා කිලිනොච්චියේ පැවති පුහුණු වැඩසටහනක් සඳහා රු.7,033,636 ක වියදමක් දරා තිබීම, භූ විද්‍යාඥයින්ගේ සංගමය මගින් පවත්වා තිබූ ඩිප්ලෝමා පාඨමාලාවක් වෙනුවෙන් රු.3,524,150 ක වියදමක් දරා තිබීම හා නව රේගු නියාමකවරුන් හා සහකාර රේගු අධිකාරිවරුන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා රු.3,833,116 ක වියදමක් දරා තිබීම යනාදී හේතු දේශීය පුහුණු වියදමේ අසාමාන්‍ය ඉහළ යාම සඳහා හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් හා රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල් වලින් සියයට 20 කට සමාන මුදල් ප්‍රමාණයක් මෙම අරමුදලට බැර කරනු ලබන අතර රේගු ආඥා පනතේ 153 (ආ) 1 වගන්තිය අනුව අරමුදලේ කාර්යයන් පහත සඳහන් පරිදි විය.

- රේගු කළමනාකරණයෙහි සඵලතාව වර්ධනය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන පහසුකම් සැලසීම සඳහා වියදම් දැරීම.
- ස්ථිර වශයෙන් හෝ පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අබල වූ හෝ තාවකාලික අශක්නුතාවයකට පත්වූ යම් රේගු නිලධාරීන්ට වන්දි ගෙවීම.
- යම් රේගු නිලධාරියෙකු මිය ගිය විට ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයන්ට වන්දි ගෙවීම.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රේගු ආඥා පනත ප්‍රකාරව, වර්ෂ ගණනාවක සිට වන්දි අරමුදලට මුදල් බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට අරමුදලේ සමුච්චිත ශේෂය රු.මිලියන 5,420 ක් වී තිබූ අතර එය ඉකුත් වර්ෂයේ ශේෂයට වඩා රු.මිලියන 689 ක හෙවත් සියයට 15 ක වැඩිවීමක් විය. තවද, සමාලෝචිත වර්ෂයට අදාළ අරමුදලේ ආදායම රු. මිලියන 936 ක් වුවද අරමුදලේ මූලික අරමුණු වෙනුවෙන් වැයකර ඇති මුදල ආසන්න වශයෙන් රු.මිලියන 107 ක් පමණක් විය. ඒ අනුව අරමුදල සඳහා අඛණ්ඩව ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණ ද විධිමත් පුරෝකථනයකින් හා සැලසුමකින් එම අරමුදල්, අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදාගෙන නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. තවද, අරමුදලේ සමුච්චිත ශේෂයේ අඛණ්ඩ වර්ධනය සඳහා පහත සඳහන් හේතුද මූලික වශයෙන් බලපා තිබුණි.

(i) රේගු බදු වංචාවන් පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් පියවර අනුගමනය නොකිරීම හේතුවෙන් ඉකුත් වර්ෂ 05 ක කාලය තුළ අරමුදලට මුදල් ලැබී තිබුණු රේගු විමර්ශන සංඛ්‍යාව හා රේගු වැරදිවල මූල්‍යමය වටිනාකම පහත පරිදි ඉහළ ගොස් තිබීම.

| වර්ෂය | වැඩ අවසන් කර තිබූ විමර්ෂන සංඛ්‍යාව | රේගු වැරදිවල මූල්‍යමය වටිනාකමින් අරමුදලට වෙන්කළ මුදල් ප්‍රමාණය |
|---|---|---|
| | | රු. |
| 2012 | 183 | 362,419,680 |
| 2013 | 200 | 592,887,505 |
| 2014 | 258 | 516,223,741 |
| 2015 | 296 | 588,065,427 |
| 2016 | 267 | 936,815,186 |

(ii) රේගු වැරදි සඳහා දණ්ඩන පැනවීමේදී අහිමි වූ රජයේ බදු ආදායමද එම දණ්ඩනයේ කොටසක් ලෙස සැලකීම හේතුවෙන් නිලධාරීන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් මෙන්ම මෙම අරමුදලට වෙන්කරන මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් නිරීක්ෂණය වීම.

(iii) වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයන හා අපනයනයන්වල ඇතිවී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත හා අදාළ අරමුදල්වල නෛතික විධිවිධාන විධිමත්ව හා කාලීනව සංශෝධනය වී නොතිබීම.

(ආ) මෙම අරමුදලේ මූලික අරමුණු වලින් එකක් ලෙස රේගු නිලධාරීන් සිය රාජකාරීවල නිරත වීමේදී වන ආපදාවන්ට වන්දි ගෙවීම හඳුනාගෙන තිබුණි. එහෙත් පරීක්ෂාවට භාජනය කරන ලද ඉකුත් වර්ෂ 05 ක කාලපරිච්ඡේදය තුළ එවැනි කිසිදු වන්දි ගෙවීමක් වාර්තා වී නොතිබියදී අඛණ්ඩව මෙම අරමුදලට අසාමාන්‍ය ලෙස මුදල් රැස් කිරීම විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය.

(ඇ) අරමුදලේ ප්‍රධාන අරමුණුවලට පරිබාහිරව ජංගම නොවන වත්කම් මිලදී ගැනීම, යන්ත්‍ර නඩත්තුව හා බලපත්‍ර ගාස්තු යනාදී වැය විෂයයන් සඳහා සමාලෝචිත වර්ෂයේදී ද වැය දරා තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික කාර්යසාධන වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2017 ජුනි 06 දිනදීය.

**5.2** **අයවැය ලේඛනමය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් සහ රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල් වලින් සියයට 20 ක ප්‍රමාණයක් මෙම අරමුදලටද, සියයට 50 ක ප්‍රමාණයක් රේගු ත්‍යාග අරමුදලටද, ඉතිරි සියයට 30 ක ප්‍රමාණය ඒකාබද්ධ අරමුදලටද, බැර කරනු ලැබේ. සමාලෝචිත වර්ෂය සඳහා රේගු ත්‍යාග අරමුදලේ ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 1,750 ක් වීම හේතුවෙන් ප්‍රතිශතාත්මකව ගත්කළ කළමනාකරණ හා වන්දි අරමුදලේ ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 700 ක් විය යුතුය. එහෙත් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී එය රු.මිලියන 740 ක් ලෙස සැලකීම හේතුවෙන් කළමනාකරණ හා වන්දි අරමුදලේ ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 40 කින් අධිතක්සේරු වීමක් නිරීක්ෂණය විය. ඒ අනුව, අරමුදලේ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී තාර්කික මට්ටමක පිහිටා කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ආ) අරමුදලේ වැය විෂයයන් පහකට අදාළව අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 62 සිට සියයට 1654 දක්වා වූ පරාසයක් තුළ විචලනයන් පැවති අතර ආදායම් විෂයයන් දෙකකට අදාළව අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 57 ක හා සියයට 37 ක විචලනයන් පැවතුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) විදේශ පුහුණු | | විදේශ පුහුණු කටයුතු සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම. |
| (ආ) ආදායම් පාලනය | | අරමුදලට ලැබිය යුතු ආදායම් හා ලැබී ඇති අරමුදල් අතර විමර්ශන ලිපිගොනු සැසඳීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති වීම. |
| (ඇ) ගිණුම්කරණය | (i) | ගිණුම් තැබීම හා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුගත නොවීම. |
| | (ii) | ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන ගිණුම සමග සම්බන්ධ ගනුදෙනු සඳහා පාලන ගිණුමක් පවත්වාගෙන නොයාම. |
| | (iii) | ගිණුම් ශේෂ ඊට අදාළ උපලේඛන සමග සැසඳුම් නොකිරීම. |